ජාතික තරුණ සේවා සභාව - 2025

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ජාතික තරුණ සේවා සභාවේ 2025 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, සභාවේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2025 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සභාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සභාව ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සභාවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව,සභාවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි සභාවේ ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකබව මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සහ ඊට අදාළ විගණන සාක්ෂි ලබා ගැනීමට අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සභාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. මාගේ නිගමනය පදනම් වී ඇත්තේ මාගේ විගණන වාර්තාවේ දිනය දක්වා ලබාගත් විගණන සාක්ෂි මතය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සභාවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සභාව ක්‍රියා කර ඇති බව,

- සභාව සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සභාව සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව

1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම.

අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති (ශ්‍රී.ලං.රා.අ.ගි.ප්‍ර) 06- වාර්තා කරන දිනෙන් පසුව සිදුවන සිද්ධීන් යන ප්‍රමිතිය ප්‍රකාරව හා ශ්‍රී.ලං.රා.අ.ගි.ප්‍ර 08 - ප්‍රතිපාදන, අසම්භාව්‍ය බැරකම් හා අසම්භාව්‍ය වත්කම් ප්‍රමිතියෙහි 100 ඡේදයේ ප්‍රකාරව අසම්භාව්‍ය බැරකම් මූල්‍ය ප්‍රකාශන වල හෙළිදරව් කලයුතු වුවත් නඩු තීන්දුවක් අනුව 2026 වර්ෂයේ පෙබරවාරි මස බාහිර පාර්ශවයන් වෙත රු.7,992,230ක් ගෙවීම් කර තිබුණද ඒ සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.	එකග වේ.	ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව අසම්භාව්‍ය බැරකම් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළ යුතුය.

1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

	විගණන නිරීක්ෂණය	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සභාව යටතේ පවත්වාගෙන යනු ලබන ක්‍රීඩා සමාජය හා යෞවන තිළිණ ප්‍රදාන අංශය සතුව පැවතුණු එකතුව රු.38,151,084ක ස්ථාවර තැන්පතු, ඉතිරි කිරීමේ ශේෂ හා ජංගම ගිණුම් ශේෂය සභාවේ මූල්‍ය ප්‍රකාශනවලට ගෙන නොතිබුණි.	2025 වර්ෂයේ ජාතික තරුණ සේවා සභාවේ මූල්‍ය ප්‍රකාශනයන්හි ගිණුම්කරණ සටහන් අංක 9 හි යෞවන තිළිණ ප්‍රධාන අංශයේ සහ ජාතික තරුණ සේවා සභාවේ ක්‍රීඩා සමාජයේ ස්ථාවර තැන්පතු ශේෂ, ජංගම ගිණුම් සහ ඉතුරුම් ගිණුම් ශේෂ සටහනක් ලෙස ඉදිරිපත් කර ඇත.	සභාවට අයත් ක්‍රීඩා සමාජය හා යෞවන තිළිණ අංශවල බැංකු ගිණුම් ශේෂ සභාවේ මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතුය.
(ආ)	2024 වර්ෂයේදී රේඛීය අමාත්‍යාංශ ප්‍රතිපාදන යටතේ දිස්ත්‍රික් ලේකම් කාර්යාල 10ක් මගින් සභාව වෙනුවෙන් මිලදීගෙන තිබුණු රු.5,090,100ක් මූල්‍ය ප්‍රකාශනවලට දක්වා නොතිබීමෙන් වත්කම් එම වටිනාකමින් ඌණ ගණනය වී තිබුණි.	එකඟ වේ.	දිස්ත්‍රික් ලේකම් කාර්යාලවලින් මිලදීගත් වත්කම් සභාවේ මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතුය.

1.5.3 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

විෂයය	මූලාශ්‍ර ප්‍රකාශන අනුව වටිනාකම රු.	අනුරූපී වාර්තා අනුව වටිනාකම රු.	වෙනස රු.	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
ශ්‍රී ලංකා යුත් සර්විසස් (ප්‍රයිවෙට්) ලිමිටඩ් වෙත ගෙවිය යුතු ශේෂය	11,076,424	209,550,376	198,473,952	එකඟ වේ.	නිවැරදි ණයහිමි ශේෂ හඳුනාගෙන අවශ්‍ය ගැලපීම් කිරීමට කටයුතු කළ යුතුය.

1.5.4 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම.

	විෂය	මුදල (රු).	නොසැපයූ සාක්ෂි	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ප්‍රධාන කාර්යාලයේ බැංකු ජංගම ගිණුම් 03ක එකතුවෙහි පැවති හඳුනා නොගත් බැරවීම්	38,152,567	අදාළ ශේෂ සනාථකිරීම්, ගෙවීම් වවුචර්, අදාළ ලිපිගොණු සහ වෙනත් අවශ්‍ය සාක්ෂි සහ තොරතුරු	එකඟ වේ.	විගණනය සිදු කිරීමට අදාළ සාක්ෂි නිසි පරිදි නොපමාව ඉදිරිපත් කළ යුතුය.
(ආ)	ණයගැතියෙක්	1,524,550	ශේෂ සනාථකිරීම්		
(ඇ)	වෙළෙඳ ණයහිමියෝ	88,937,916	ශේෂ සනාථකිරීම්		
(ඈ)	රේඛීය අමාත්‍යාංශයෙන් හා වෙනත් ආයතනවලින් ලැබීම්	189,923,072	ශේෂ සනාථකිරීම්		
(ඉ)	කෙරීගෙන යන වැඩ	18,771,565	ගෙවීම් වවුචර් හා අදාළ ලිපිගොණු		
(ඊ)	රජයේ ප්‍රාග්ධන දායකය ශේෂයන්	149,620,000	වර්ෂයට අදාළ ගණුදෙණු හා සිද්ධීන් පිළිබඳ තොරතුරු	2025 වර්ෂය තුළ ප්‍රාග්ධන දායකයේ වර්ධනයට හේතුව වර්ෂය තුළ ප්‍රාග්ධන වත්කම් අත්පත් කර ගැනීමට දරා ඇති වියදම වේ.	රජයේ ප්‍රාග්ධන දායක ගිණුමෙන් සිදුකරන ලද ප්‍රාග්ධන වියදම් පිළිබඳ තොරතුරු ලෙජරය අනුව නිවැරදිව ඉදිරිපත් කළ යුතුය.

1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

1.6.1 ලැබිය යුතු මුදල්

	විගණන නිරීක්ෂණය	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2025 දෙසැම්බර් 31 දිනට ණයගැති ශේෂය රු.5,624,550 ක්වූ අතර, එම ශේෂය තුළ 2023 වර්ෂයේ යෞවන සමාජ සම්මේලනයට ලබාදී තිබූ රු.4,000,000ක ණය මුදලක් හා සැපයුම්කාර ආයතනයක් වෙත දෙවරක් ගෙවීම මත අයකර ගත යුතු රු.1,624,550ක ශේෂය වන අතර, මෙම මුදල් අයකර ගැනීම සඳහා මෙම වාර්තාවේ දිනය දක්වාම කටයුතුකර නොතිබුණි.	සැපයුම්කාර ආයතනය වෙත දෙවරක් ගෙවීම මත අයකරගත යුතු රුපියල් 1,624,550ක මුදල අයකර ගැනීම සඳහා ලිපි යවා ඇත.	ණයගැති ශේෂ කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය.
(ආ)	2025 දෙසැම්බර් 31 දිනට සේවය අතහැර, ඉවත්ව ගිය, විශ්‍රාම ගිය හෝ මියගිය පුද්ගලයන්ගෙන් 33 දෙනෙකුගෙන් අයවිය යුතු රු.2,999,036ක ආපදා ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.	එකඟ වේ.	හිඟහිටි ආපදා ණය අයකර ගැනීමට කටයුතු කළ යුතුය.

1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

	නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව.	අනුකූල නොවීම	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ II වන කාණ්ඩයේ XLVIII පරිච්ඡේදය 30 කොටසෙහි සඳහන් 30 වගන්තිය	2018 සිට 2025 දක්වා කාල පරිච්ඡේදය තුළදී සිදුකරන ලද විනය පරීක්ෂණ 03ක් සඳහා චූදිත නිළධරීන්ට විරුද්ධව විනයානුකූලව කටයුතු කිරීමට විනය බලධරයා ක්‍රියාකර නොතිබුණි.	සභාවේ නිළධාරීන් තිදෙනෙකු සම්බන්ධව මූලික විමර්ෂණයට අදාළව සිහි කැඳවීමේ ලිපි, පොලිසියට පැමිණිලි කිරීම් කටයුතු සිදුකර ඇත.	අදාළ නිළධාරීන් සම්බන්ධයෙන් කඩිනම් හා විධිමත් විනයානුකූල පරීක්ෂණ පැවැත්වීමට කටයුතු කළ යුතුය.
(ආ)	2023ජනවාරි 31 දිනැති අංක 009/601/0190/28 දරන අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව	“රජයේ ආයතනවලට විරුද්ධව බාහිර පාර්ශවයක් විසින් නඩු පවරනු ලබන කටයුතු සඳහා නීතිපති දෙපාර්තමේන්තුවේ සේවය කරනු ලබන නීතිඥවරුන්ගේ සේවය පමණක් ලබාගැනීමට කටයුතු කළ යුතු වුවත්, ඊට පටහැනිව සභාවට එරෙහිව බාහිර පාර්ශවයන් විසින් පවරා තිබූ නඩු වෙනුවෙන් පෙනී සිටීම සඳහා පෞද්ගලික නීතිඥවරුන්ගේ සේවය ලබාගෙන ඒ සඳහා	ඇතැම් අවස්ථාවලදී නඩු කටයුතු සඳහා ඉක්මනින් කැඳවන නිසා රජයේ නීතිඥවරයෙකු යොදා ගැනීමේ අපහසුතාවය හේතුවෙන් පෞද්ගලික නීතිඥවරුන්ගේ සහය ලබා ගැනීම සිදු කර ඇත .	අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව අනුව කටයුතු කළ යුතුය.

		රු.16,974,380ක් වැයකර තිබුණි.		
(ඇ)	2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන රාජ්‍ය සතු ව්‍යාපාර සඳහා වන මාර්ගෝපදේශ සංග්‍රහයේ			
(i)	2.1 ඡේදය	සභාපතිවරයා සහ ප්‍රධාන විධායක නිළධාරියාගේ කාර්ය හා කර්තව්‍යය අදාළ නීති මගින් ඒකාබද්ධ කර ඇති ඕනෑම අවස්ථාවක එම නෛතික පසුබිම ඒවා බෙදා වෙන් කිරීම් කර ගැනීමට අධ්‍යක්ෂ මණ්ඩලය පියවර ගතයුතු වුවද, සභාවේ සභාපතිවරයා ලෙසත්, ප්‍රධාන විධායක නිළධාරී ලෙසත් කටයුතු කරන සභාපතිවරයාගේ කාර්යය හා කර්තව්‍යය පිළිබඳ වෙන්කර දැනට පවතින පනත සංශෝධනය කිරීමට සභාව විසින් කටයුතු කර නොතිබුණි.	මේ සම්බන්ධයෙන් සභා අධ්‍යක්ෂ මණ්ඩලය වෙත යොමුකර ලැබෙන තීරණය අනුව කටයුතු කිරීමට නියමිතය.	මාර්ගෝපදේශවලට අනුකූලව කටයුතු කළ යුතුය.
(ii)	6.7ඡේදය	ස්ථාවර වත්කම් හා තොග සම්බන්ධයෙන් වාර්ෂික වත්කම් සත්‍යාපනයක් සිදු කර භාණ්ඩ සමීක්ෂණ වාර්තා විගණනයට ඉදිරිපත් කළ යුතු වුවද, එසේ සිදුකර නොතිබුණි.	මේ වන විට ශිෂ්‍ය නේවාසිකාගාරය හැර අනෙකුත් සියලු අංශවල සමීක්ෂණ කටයුතු අවසන් කර ඇත.	භාණ්ඩ සත්‍යාපනය වාර්ෂිකව නීති ප්‍රකාරව සිදුකළ යුතුය.
(ඈ)	2024 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය 2.9.1 මාර්ගෝපදේශයට අතිරේකව රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව විසින් 2017 මාර්තු 01 දින නිකුත් කරන ලද 32 වන අතිරේකය	2025 ජාත්‍යන්තර තරුණ දිනය සැමරීම සඳහා රු.මිලියන 44.6ක් වැයකර විවිධ කාර්යයන් සඳහා ප්‍රසම්පාදනය කිරීමේදී මූළ පිරිවැය ඇස්තමේන්තුවක් ලබාගැනීමකින් තොරව හා ප්‍රසම්පාදන කමිටුවලට සභය වන මාණ්ඩලික නිළධාරීන් සහ අනෙකුත් නිළධාරීන්ගෙන් මෙන්ම ලංසුකරු හෝ නියෝජිතයා විසින් ඉදිරිපත් කළ යුතු බවට දිවුරුම් ප්‍රකාශයක් ලබාගැනීමකින් තොරව එම ප්‍රසම්පාදනය සිදුකර තිබුණි. තවද ප්‍රසම්පාදන	වර්තමානයේ සිදු කරනු ලබන සියළු ප්‍රසම්පාදන කටයුතු දූස්සන්ධානීය නොවන බවට දිවුරුම් ප්‍රකාශ ලබා ගන්නා ලදී.	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට අනුව කටයුතු කළ යුතුය.

		මාර්ගෝපදේශ සංග්‍රහයට අනුව ගිවිසුමකටද එළඹ නොතිබුණි.		
(ඉ)	ජනාධිපති ලේකම් විසින් නිකුත් කරන ලද 2018 දෙසැම්බර් මස 07 වන දිනැති චක්‍රලේඛ අංක PS/SP/SB/21/2018	රාජ්‍ය ආයතනවල උත්සව, සම්මන්ත්‍රණ හා වැඩමුළු අවම පිරිවැයක් දරමින් රජයට අයත් උත්සව ශාලාවල සිදුකළ යුතු වුවත්, 2024 හා 2025 වර්ෂවලදී යෞවන සිනමා උළෙල පෞද්ගලික හෝටල්වල පැවත්වීමට දරන ලද වියදම රු.12,556,970 ක් විය.	සභාපති/අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ අධිකාරි බලය, නිර්දේශය හා අනුමැතිය මත උක්ත වැඩසටහන ක්‍රියාත්මක කරන ලදි.	චක්‍රලේඛ උපදෙස් පිළිපැදිය යුතුය.
(ඊ)	2009 අප්‍රේල් 16 දිනැති 09/2009 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය	ගම්පහ, නුවරඑළිය සහ කෑගල්ල දිස්ත්‍රික් කාර්යාල වල සේවයේ නියුතු කොට්ඨාශ භාර නිළධාරීන් විසින් ඇඟිලි සලකුණු යන්ත්‍රයේ සටහන් කිරීමකින් තොරව 2025 වර්ෂය මුළුල්ලේ වැටුප් ලබා ගෙන ඇති බව ක්ෂේත්‍ර විගණන පරීක්ෂාවේදී විගණනය විය.	මේ වන විට සියළු කාර්යාල වල ඇඟිලි සලකුණු යන්ත්‍ර යාවත්කාලීන කර ඇත.	චක්‍රලේඛ උපදෙස් පරිදි කටයුතු කළ යුතුය.
(උ)	මුදල් රෙගුලාසි 104	සපුගස්කන්ද පුහුණු මධ්‍යස්ථානයේ අධි බලැති විදුලි රැහැන් සොරුන් විසින් කපා ඉවත් කිරීම සම්බන්ධයෙන් සිදුවූ රු.1,102,714ක අලාභය හා 2026 වර්ෂයේ සිදුවූ රු.609,092ක පාඩුව හානි පාඩු ලේඛනවල සටහන් කර නොතිබුණි. තවද විධිමත් විනය පරීක්ෂණයක් පවත්වා එම සිදුවූ පාඩුව විගණකාධිපති වෙත වාර්තා කලයුතු වුවත් එසේ සිදු කර නොතිබුණි.	ඒ සම්බන්ධයෙන් අදාල නිලධාරීන් විසින් කරුණු ඉදිරිපත් කර ඇත. එම කරුණු සැළකිල්ලට ගනිමින් ඒ සඳහා වග කිව යුතු පාර්ශවයන් සම්බන්ධයෙන් ඉදිරි කටයුතු කිරීමට නියමිතය.	වගකිව යුතු පාර්ශවයන්ගෙන් පාඩුව අයකර ගැනීමට කටයුතු කළ යුතුය.

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.මිලියන 268.97ක ඌනතාවයක් වූ අතර, ඊට අනුරූප ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.මිලියන 531.22ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.මිලියන 262.25ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට රජයේ ප්‍රදාන හා අභ්‍යන්තර ඉපයීම් වැඩිවීම මෙන්ම තරුණ සංවර්ධන වියදම් අඩුවීමද ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

සමාලෝචිත වර්ෂයේ ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්, ඉකුත් වර්ෂය සමඟ සසඳා විශ්ලේෂණය කර වැඩිවීම් හෝ අඩුවීම්වල ප්‍රතිශතයන් ඇඟයීමට ලක්කර පහත දක්වා ඇත.

	2025 වර්ෂය	2024 වර්ෂය	වෙනස [වාසිදායක/ (අවාසිදායක)]	ප්‍රතිශතය
	(රු.මිලියන)	(රු.මිලියන)	(රු.මිලියන)	(%)
ආදායම				
රජයේ ප්‍රදාන	2,039.41	1,902.15	137.26	7
අභ්‍යන්තර ඉපයීම්	405.12	367.03	38.09	10
වියදම				
පරිපාලන වියදම්	2,001.38	1,747.46	(253.92)	14
තරුණ සංවර්ධන වියදම්	712.12	1,052.94	340.82	32

සභාව විසින් ඉටුකළ යුතුව පැවති ප්‍රධාන කාර්යයන් දෙකක් මේවන විටත් ක්‍රියාත්මක කිරීමට නොහැකි වීමෙන් සහ අපේක්ෂිත තරුණ සංවර්ධන වියදම් නොකිරීමෙන් පෙර වර්ෂයට සාපේක්ෂව තරුණ සංවර්ධන වියදම් සියයට 32කින් අඩුවී තිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

	විගණන නිරීක්ෂණය	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	බටංගල පුහුණු මධ්‍යස්ථානයේ දෛනික ආදායම් පිළිබඳ 2024 අප්‍රේල් සිට දෙසැම්බර් හා 2025 ජනවාරි සිට ජුනි දක්වා එකතු කරන ලද රු.1,841,193ක දෛනික ආදායම් 2025 සැප්තැම්බර් 03 දින දක්වා බැංකුගත කර නොතිබීම සම්බන්ධයෙන් විනය ක්‍රියාමාර්ග විගණිත දින දක්වා අවසන් කර අලාභ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.	විනය ක්‍රියාමාර්ග ගැනීමට අපේක්ෂිතය.	දෛනික ආදායම් බැංකුගත කිරීම පිළිබඳව පසුවිපරම් කර, දෛනික මුදල් බැංකුගත කිරීම ප්‍රමාද වී ඇති බව හෝ බැංකුගත නොකර තිබේදැයි පරීක්ෂා කර වගකිව යුතු පාර්ශවයන් සම්බන්ධව කඩිනමින් ක්‍රියාමාර්ග ගත යුතු බව.
(ආ)	සභාව යටතේ තරුණ මධ්‍යස්ථාන ක්‍රීඩා සමාජයක් පවත්වාගෙන ගොස් තිබුණද එවැනි ක්‍රීඩා සමාජයක් පවත්වා ගැනීම සම්බන්ධයෙන් නෛතික පසුබිමක් නොවීය.	අවශ්‍ය නෛතික ප්‍රතිපාදන සහ විධිමත් අනුමැතිය ලබා ගැනීමට කටයුතු කෙරෙමින් පවතී.	තරුණ මධ්‍යස්ථාන ක්‍රීඩා සමාජයේ නීත්‍යානුකූලභාවය තහවුරු කළ යුතුය.

3.2 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	1979 අංක 28 දරන දේශීය ආදායම් පනතේ 31(9)(අ) වගන්තිය යටතේ පුණ්‍යායතනයක් ලෙස පිහිටුවා ඇති ශ්‍රී ලංකා යෞවන සමාජ සම්මේලනය නීත්‍යානුකූල නොවන පදනමකින් ජාතික තරුණ සේවා සභාව යටතේ ප්‍රධාන කාර්යාලයේ අංශයක පිහිටුවා සම්මේලනයේ සාමාජිකයන් 10 දෙනෙකුට 2018 වර්ෂයේ සිට මසකට රු. 750ක් බැගින් සභාව විසින් සමාලෝචිත වර්ෂය අවසාන වන විට රු. 1,197,700ක් දීමනා ලෙස ගෙවා තිබුණි. තවද මෙම සම්මේලනයේ සභාපතිවරයා, සභාවේ සභාපතිවරයාද වේ.	2018 වර්ෂයේ සිට මෙම දීමනාව ලබා දී ඇත. ඒ සඳහා සභා අධ්‍යක්ෂ මණ්ඩල තීරණය මගින් අනුමැතිය ලබාගෙන ඇත.	මෙවැනි දීමනා නීත්‍යානුකූලව ලබාදීමට කටයුතු කළ යුතුය.
(ආ)	සභාවේ නිළ නාමය හා නිල ලාංඡනය මෙන්ම රේඛීය අමාත්‍යාංශ නාමයද භාවිතා කරමින් සී/ස ශ්‍රී ලංකා ජාතික තරුණ සේවා සමූපකාර සමිති සංගමය පාඨමාලා පවත්වාගෙන යන අතර, මෙම සමූපකාර සමිතිය හා සභාව අතර පවතින නීත්‍යානුකූල සම්බන්ධතාවය විගණනයට පැහැදිලි නොවිය. තවද, ඉහත සමූපකාර සමිතියේ සභාපති, සාමාන්‍යාධිකාරී හා අධ්‍යක්ෂ මණ්ඩලයට සභාවේ නිළධාරීන් පූර්ණකාලීන හා අර්ධකාලීනව පත්කර තිබුණි. තවද, සභා පරිශ්‍රයේ සමූපකාර සමිතිය විසින් "නිස්කෝ පොළ" නමින් අලෙවි වැඩසටහනක් පවත්වා තිබුණු අතර එම වැඩසටහන මගින් උපයන ලද ආදායම් සභාවට ලැබී නොතිබුණි.	2025 දෙසැම්බර් පැවැත්වූ නිස්කොපොළ වැඩසටහන සඳහා ගෙවිය යුතු මුදල් වලට අදාල ලේඛන නිස්කෝ සමූපාකාරය වෙත යොමු කර ඇත.	සභාව, අමාත්‍යාංශය හා සමූපකාර සමිති අතර පවතින නීත්‍යානුකූල පසුබිම තහවුරු කළ යුතුය.

3.3 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
සභාවේ බහුකාර්ය ගොඩනැගිල්ලේ වහළය අබලන් වීම හේතුවෙන් එය අළුත්වැඩියා කිරීම සඳහා උපදේශන ගාස්තු වශයෙන් රු.මිලියන 49.62ක් ගෙවා තිබුණද, මෙම කාර්යය සඳහා කොන්ත්‍රාත්කරුවෙකු තෝරාගෙන නොතිබීමෙන් එම ගොඩනැගිල්ල දැනටමත් ප්‍රයෝජනයට ගත නොහැකි මට්ටමක පැවතුණි.	කඩිනමින් ප්‍රසම්පාදන කටයුතු සිදු කිරීමට කටයුතු සකස් කර ඇත.	සභාවේ වත්කම් ඵලදායීව උපයෝජනය කළ යුතුය.

3.4 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

විගණන නිරීක්ෂණය	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
වටිනාකම රු.162,944,263ක්වූ කොන්ත්‍රාත් 04ක ඉදිකිරීම් කටයුතු 2013 වර්ෂයේ සිට 2020 දෙසැම්බර් 31 කාල පරාසය තුළ අත්හිටුවා තිබුණද, මෙම ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් කළමනාකරණය කඩිනම් පියවර ගෙන නොතිබුණි.	මාතර යොවුන් උද්‍යානය, පිළියන්දල නේවාසිකාගාරය හා වොලිබෝල් ක්‍රීඩා පිටිය ප්‍රතිපාදන වෙන් නොවූ බැවින් ව්‍යාපෘතිය ඉදිරියට කරගෙනයාමට නොහැකි වී ඇත. බෙල්වුඩ්, මොනරාගල මධ්‍යස්ථාන මූල්‍ය සීමාවන් මත කොටස් වශයෙන් වැඩ නිම කරමින් පවතී.	අතරමග නැවැත්වූ කොන්ත්‍රාත් අවසන් කර ගැනීමට කළමනාකරණය කඩිනමින් ක්‍රියාකළ යුතුය.

3.5 වෙනත් සංවිධානවල සම්පත් උපයෝජනය කිරීම

විගණන නිරීක්ෂණය	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
2025 දෙසැම්බර් 31 දිනට දහතුන් වසරක සහතික කරන ලද අධ්‍යාපන වැඩසටහන යටතේ අධ්‍යාපන අමාත්‍යාංශයෙන් ලද එකතුව රු. 93,375,719ක්වූ මුදලින් ඉතිරිව පැවති මුදල වන රු. රු.74,685,728ක් අදාළ අරමුණු සඳහා උපයෝජනය කර නොතිබුණි.	“මෙම වැඩසටහනේ අරමුණ පරමාර්ථ ඉටුකර ගැනීම සඳහා කටයුතු කර ඇත.” ලෙස නිවැරදි නොවන පිළිතුරක් ඉදිරිපත් කර ඇත.	ලැබෙන ප්‍රතිපාදන ඵලදායීව උපයෝජනය කළ යුතුය.

3.6 මානව සම්පත් කළමනාකරණය

විගණන නිරීක්ෂණය	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
අනුරාධපුර යොවුන් නිකේතනයට අනුයුක්ත කරන ලද නිකේතනාධිපති හා සංගීත උපදේශකවරයෙකු සඳහා කිසිදු කාර්ය පැවරීමක් ලබාදී නොතිබුණු අතර, ඔවුන්ගේ කාර්යසාධනය පිළිබඳ ඇගයීමක්ද සිදු නොකර සමාලෝචිත වර්ෂයේදී රු.4,320,786ක් වැටුප් වශයෙන් ගෙවා තිබුණි.	අනුරාධපුර යොවුන් නිකේතනයට අනුයුක්ත කර තිබූ නිකේතනාධිපති ප්‍රධාන කාර්යාලයට ස්ථාන මාරු කර රාජකාරි පවරා ඇත.	කාර්ය මණ්ඩලය සඳහා කාර්ය පැවරුම් නිසි පරිදි ලබා දිය යුතුය.

3.7 වාහන පද්ධතිය කළමනාකරණය

විගණන නිරීක්ෂණය	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
සභාව සතු වාහන 10ක් 2011 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා කාලපරිච්ඡේදය තුළ ධාවනයෙන් ඉවත්කර ඇති නමුත්, වාර්තාවේ දින දක්වා වෙන්දේසි කිරීමට අවශ්‍ය පියවර නොගෙන දීර්ඝ කාලයක් ප්‍රධාන කාර්යාලයේ කිසිදු ආවරණයක් නොමැතිව ගාල්කර තැබීමට ඉඩහැරීම තුළින් වාහන දිරාපත් වෙමින් පැවතුණි.	නව චක්‍රලේඛ අනුව අපහරණයට කටයුතු ආරම්භ කිරීමට අනුමැතිය ලබා ගන්නා ලදි .	දිරාපත් වෙමින් ගාල්කර ඇති වාහන වෙන්දේසි කිරීමට හෝ අළුත්වැඩියා කර නැවත භාවිතා කිරීමට කටයුතු කළ යුතුය.

4. ගිණුම් කටයුතුභාවය සහ යහ පාලනය

4.1 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සහ අරමුණු කරගත් ක්‍රියාකාරකම්වල ප්‍රගතිය

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සභාව මගින් ඉටුකළ යුතුව පැවති පහත සඳහන් කාර්යයන් සමාලෝචිත වර්ෂය තුළදී ඉටු කළේද යන්න පිළිබඳව ඇගයීමක් කිරීමට හැකිවන පරිදි ප්‍රධාන කාර්යසාධන දර්ශක, ඉලක්ක හෝ ඊට වගකිව යුතු නිළධාරීන් හඳුනාගෙන නොතිබුණු අතර, ඒවා පිළිබඳ ප්‍රගති වාර්තාවක්ද ඉදිරිපත් කර නොතිබුණි.		
	• රැකියා විරහිත තරුණ තරුණියන් පිළිබඳ තොරතුරු රැස්කිරීම සඳහා දත්ත සමුදාය පද්ධතියක් පිහිටුවීම, ඔවුන් ස්ථානගත කිරීම සඳහා රැකියා බැංකුවක් පිහිටුවීම සහ විරැකියාව ක්‍රමානුකූලව අවම කිරීම සඳහා මාර්ගගත වේදිකාවක් හරහා අදාළ ක්‍රියාවලිය කළමනාකරණය කිරීම.	රැකියා විරහිත තරුණ තරුණියන් පිළිබඳ තොරතුරු රැස්කිරීම සඳහා Youth App නමින් මෘදුකාංගයක් හඳුන්වා දී ඇති අතර, එය වැඩිදියුණු කරමින් පවතින අතර, එය අවසන් වූ පසු මෙම ක්‍රියාවලිය විධිමත්ව ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිතය.	සභාව විසින් ඉටු කල යුතු කාර්යයන් කාර්යක්ෂමව හා ඵලදායීව ඉටු කල යුතුය.
	• තරුණ ව්‍යවසායකයින් බිහිකිරීමට පියවර ගැනීම සහ ඔවුන්ට අවශ්‍ය දිරිගැන්වීම් හා නව අවස්ථාවන් සලසා දීම සඳහා ක්‍රමවේද හඳුන්වා දී ක්‍රියාත්මක කිරීම.	දිවිනා සුළිකුණාටු තත්ත්වය මත හඳුන්වා දුන් වැඩසටහන ක්‍රියාත්මක කිරීමට නොහැකි විය.	සභාව විසින් ඉටු කල යුතු කාර්යයන් කාර්යක්ෂමව හා ඵලදායීව ඉටු කල යුතුය.
(ආ)	1979 අංක 69 දරන ජාතික තරුණ සේවා සභා පනතේ 4 (ඊ), 5(2)(උ) සහ 5(2)(ඌ) වගන්ති ප්‍රකාරව තරුණ තරුණියන් කෘෂිකර්ම ක්ෂේත්‍රයට නැඹුරු කිරීමට ගොවිපොළවල් ආරම්භ කිරීම අරමුණ වුවද, සභාවේ පවතින ගොවිපොළ 15ක පුහුණු පාඨමාලා පවත්වා නොතිබුණි. තවද, සභාවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් 2025 ජූලි 11 දින නිකුත් කරන ලද අංක ජා.ත.සේ.ස/කෘෂි සං./පුහුණු/2025 දරන ලිපිය මගින් 2025 දෙවන අර්ධ වර්ෂයේ සිට කෘෂි අභ්‍යාසලාභීන් බඳවා ගැනීම තාවකාලිකව නතර කර තිබුණි.	පාඨමාලාවල ගුණාත්මකභාවය වැඩිදියුණු කර ඇති බවත් ඒ අනුව පාඨමාලාව යම් ප්‍රමාණයකට වෙනස් කර ඇති බව ද දන්වමි.	සභාව විසින් ඉටු කල යුතු කාර්යයන් කාර්යක්ෂමව හා ඵලදායීව ඉටු කල යුතුය.
(ඇ)	ජාතික යෞවන ක්‍රීඩා උළෙලක් සමාලෝචිත වර්ෂයේදී රු.මිලියන 168ක් වැය දරා පවත්වා තිබූ අතර, මෙම ක්‍රීඩා උළෙල පැවැත්වීම තුළින් තරුණ තරුණියන් හට ලැබූ ප්‍රතිලාභ නිශ්චිතව හඳුනාගැනීමට හැකිවන පරිදි අදාළ අරමුණු හා ඉලක්කයන් නිශ්චයට අදාල ප්‍රධාන කාර්යය සාධන දර්ශක හඳුනාගෙන නොතිබුණි.	35 වන ජාතික යෞවන ක්‍රීඩා උළෙලේ ප්‍රාදේශීය, දිස්ත්‍රික් හා ජාතික මට්ටමේ තරඟාවලි සඳහා ක්‍රීඩකයන් 188,174ක් යෞවන ක්‍රීඩා අවසන් උළෙල නියෝජනය කර ඇත.	ප්‍රධාන කාර්යය සාධන දර්ශක හඳුනාගත යුතුය.

(ඈ) 2025 පෙබරවාරි 18 හා 20 දිනවලදී සහ 2025 මාර්තු 19 දින පැවති පිළිවෙළින් පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ (COPE) හා එම කාරක සභාවේ අනු කමිටු සාකච්ඡා සටහන් අනුව සභාව ඉටුකළ යුතු පහත සඳහන් කමිටු නිර්දේශ මෙම වාර්තාවේ දිනය දක්වා ක්‍රියාත්මක කර නොතිබුණි.

(i)	රජයේ ප්‍රතිපත්ති පිළිබඳව සැළකිලිමත් වෙමින් යාවත්කාලීන සංයුක්ත සැලැස්මක් සකස් කර මාස 03ක් ඇතුළත අනු කාරක සභාව වෙත ඉදිරිපත් කිරීම.	කෙටුම්පත් කරන ලද 2026 - 2028 කාලපරිච්ඡේදය සඳහා වූ නව සංයුක්ත සැලැස්ම සභා අධ්‍යක්ෂ මණ්ඩලයේ අදහස් ලබා ගැනීම සඳහා ඉදිරිපත් කර ඇති අතර, අදහස් ලබා ගැනීමෙන් පසු ඉදිරි කටයුතු කිරීමට අපේක්ෂිතය.	පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ තීරණ කඩිනමින් ඉටු කළ යුතුය.
(ii)	රු.මිලියන 6.87ක ණය ශේෂ 144ක් කපා හැරීමට අදාළව මෙතෙක් භාණ්ඩාගාර අනුමැතිය ලබා නොගැනීමට හේතු හා වගකිව යුතු නිලධාරීන් පිළිබඳ මසක් ඇතුළත කාරක සභාවට වාර්තා කිරීම.	විගණන හා කළමණාකරන කමිටුව වෙත ඉදිරිපත් කර එහි අනුමැතිය ලබා ගැනීමෙන් අනතුරුව සභා අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කරනු ඇත .	පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ තීරණ කඩිනමින් ඉටු කළ යුතුය.
(iii)	සභාව යටතේ පවතින සියළුම ඉඩම් සම්බන්ධයෙන් අදාළ අනුමැතීන් ලබා ගත යුතු වුවද, සභාව බුක්ති විඳින ඉඩම් 90කින් 79ක් සභාව සතු නොවූ අතර 11ක් තෑගි සින්නක්කර ඉඩම් විය .මේ පිළිබඳ අධ්‍යනය කර නිර්දේශ ඉදිරිපත් කිරීම.	ජාතික තරුණ සේවා සභාව විසින් පරිහරණය කරන ඉඩම් වල නිත්‍යානුකූල අයිතිය ලබා ගැනීම සම්බන්ධ කටයුතු මේ වන විට සිදු කරමින් පවතී.	පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ තීරණ කඩිනමින් ඉටු කළ යුතුය.